**කොළඹ විශ්වවිද්‍යාලය - ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී සිව්වන වසර පරීක්ෂණය ( විශේෂ උපාධි )**

**පළමු සෙමෙස්තරය -2018/2019**

**SLG - 4173 - විශ්ව සාහිත්‍ය පරිචය**

(පැ දෙකයි)

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න

1. විවාහය සහ ස්ත්‍රී පුරුෂ සම්බන්ධතා විෂයෙහි විශ්ව සාධාරණ නිරූපණයක් හෙන්රික් ඉබ්සන්ගේ **සෙල්ලම් ගෙය** නාට්‍යය මඟින් සිදුකර තිබේ. මේ අදහස විවරණය කරන්න.

2. **එමා බෝවාරි** නවකතාවේ නිරූපිත චාල්ස් යහපත් ස්වාමි පුරුෂයෙකු ලෙස ජීවත් වුව, එහි නිරූපිත එමා සිය සැමියා වූ චාල්ස් සමඟ යහපත් බිරිඳක ලෙසින් ජීවත් නොවූ බව පාඨකයකු විසින් නිගමනය කරනු ලබන්නේ නම්, ඒ නිගමනය කොතරම් යුක්ති යුක්තදැයි විවේචනාත්මකව විග්‍රහ කරන්න.

3. මනුෂ්‍යත්වයට පොදු වටිනාකම් ආරක්ෂා වන්නේ හෝ විනාශ වන්නේ සොබා දහමේ නියමයන්ට අනුගතව මානව ජීවිතය අවබෝධ කර ගත් අවකාශයක දී ය යන්න **අරණකට පෙම්බැඳ** නවකතාවේ කතුවරයාගේ දෘෂ්ටිය වී තිබේ. මේ අදහස සහේතුක දැයි පරීක්ෂා කරන්න.

4. "තත්කාලීන රුසියානු සමාජයෙහි පරිධිගත මිනිසාගේ ඛේදනීය ජීවිතය සම්භාව්‍ය රුසියානු කෙටිකතාවෙහි මුඛ්‍ය තේමාවයි" **සම්භාව්‍ය රුසියානු කෙටිකතා සංග්‍රහය** ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.

5. "චිනුවා අචෙබෙගේ **මුහුද ගොඩගලා** නවකතාව, අප්‍රිකානු යටත්විජිත වැසියාගේ සංකීර්ණ සංස්කෘතික ජීවිතයෙහි ප්‍රකාශනයකි " නිදසුන් සහිතව විමසන්න.

*********************